# සංවිධානයට අවශ්‍ය සංනිවේදනය

සංනිවේදනය / පණිවිඩය කුමක්ද ?

කෘෂිකාර්මික සංවර්ධනයේදී කේන්ද්‍රස්ථානය වශයෙන් සලකන්නේ පොහොර, බීජ වර්ග, කෘමි නාශක පිළිබඳව නව සොයාගැනීම්ය. මෙම සොයාගැනීම් සම්බන්ධයෙන් ගොවීන්ට තොරතුරු බෙදා හැරීම එක්තරා පණිවිඩයක් සේ සැලකිව හැක.

මීලගට මතුවන ප්‍රශ්නය මෙය අංග සම්පූර්ණ පණිවුඩයක්ද ? අපි කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව දෙන පණිවුඩය අංග සම්පූර්ණ අංග සම්පූර්ණ එකක් වීමට නම් ඊට පහත සඳහන් අංශ වලටත් අදාල තොරතුරුත් ඇතුළත් විය යුතුයි

1. පෝෂණය
2. සෞඛ්‍යය
3. පවුල් සංවිධානය
4. ණය ලබා දීම
5. විදුලිය ලබාදීම
6. වැඩි දියුණු කළ අලෙවි පහසුකම් සහ
7. වාරිමාර්ග

**ග්‍රාහකයා -**

ගොවියා නැතහොත් ගොවි කණ්ඩායමක් ග්‍රාහකයා වශයෙන් ගණින් ගැනේ. ව්‍යවස්ථාව අනුව වර්ගීකරණයක් සලකොත් ලෝකයේ සිටින විශාලම ව්‍යවසායික කණ්ඩායම වශයෙන් සැලකෙන්නේ ගොවියෝය. එහෙත් මොවුන්ගේ ජීවන මට්ටම එතරම් සතුටුදායක නොවීමට බලපෑ එක් සාධකයක් සේ සංනිවේදනයේදී ඇතිවූ අඩුපාඩු ගණින් ගත හැක.

**හැසිරීම වෙනස් කිරීම -**

**ඉහත සඳහන් කළ ආකාරයට ගොවියාට හෝ ගොවීන්ට අංග සම්පූර්ණ පණිවුඩයක් දෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජීවන මට්ටම ඉහල නැංවීම අපේක්ෂා කරයි.**

කෘෂි කාර්මික කටයුතු වඩාත් ඵලදායි අන්දමට කරන ආකාරය පිළිබඳව අවබෝධයක් දීම එක් අංශයකිනුත් අනිත් අංශයෙන් ගොවියාගේ සමාජ ආර්ථික මට්ටම උසස් තත්ත්වයකට ගෙනඑමත් "හැසිරීම වෙනස් කිරීම" තුළින් බලාපොරොත්තු වෙයි.

මේ සඳහා මෙතෙක් ගෙන ඇති ප්‍රයත්න පිළිබඳව කෙටියෙන් නමුත් සලකා බැලීම අවස්ථානුකූලය. කෘෂිකාර්මික සංවර්ධනයේ අවසාන ඉලක්කය ගොවියාගේ ආර්ථිකය සතුටුදායක අඩියකට ගෙන ඒම සේ සැලකිව හැක. මෙම පරමාර්ථය සාර්ථක කර ගැනීම සඳහා ගත් පියවර දෙකක් සඳහන් කිරීම අත්‍යවශ්‍යයැයි පෙනේ.

1. පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම
2. ව්‍යාප්ති සේවාවන් වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වැය කිරීම.


පර්යේෂණ හා පුහුණු කිරීමේ

නිලධාරී

එස්. එම්. කේ. බී. නන්දරත්න

විසිනි


පර්යේෂණ මධ්‍යස්ථානවල කළ නව සොයාගැනීම් අලලා විවිධ මාතෘකා යටතේ පත්‍රිකා රාශියක් පළ කොට තිබේ.

ශ්‍රී ලංකාවේ පමණක් නොව දියුණු වෙමින් පවත්නා රටවල් බොහොමයක කළ පර්යේෂණ වලින් රැස්කරගත් තොරතුරු වලට අනුව ගොවියෝ ව්‍යාප්ති මධ්‍යස්ථාන සහ ඒවායින් නිකුත් කරනු ලබන පත්‍රිකා පිළිබඳව ඉතාමත් අඩු අවධානයක් යොමු කරන බව හෙළි වී තිබේ. මේ සඳහා බලපෑ හේතු මොනවාද ?

1. ගොවින්ගේ අඩු අධ්‍යාපන මට්ටම
2. පත්‍රිකාවලදී පාවච්චි කල භාෂාව සාමාන්‍ය ගොවීන්ට තේරුම් ගැනීමට ඇති අපහසුව. මේසින් සිදු වූයේ කුමක් ද? නව සොයා ගැනීම් පිළිබඳව ගොවි ජනතාවට දීමට අපේක්ෂා කල පණිවුඩය නිසි පරිදි ලඟා වූයේ නැත. සංනිවේදක සින් මේ පිළිබඳව ඔවුන්ගේ දැඩි අවධානය යොමු කළ යුතුය. ගොවින් සමඟ කථා කිරීම, ඔවුන් හට යමක් කියා දීම ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම වැඩි හිටි අධ්‍යාපනයේ නිරතවූ පුද්ගලයෙකුගේ වගකීම හා සාමාන්‍ය ගොවියාට අවශ්‍ය දැනුම. පුහුණුව ලබාදෙන පුද්ගලයා තුළත් විශේෂ කුශලතාවයන් තිබිය යුතුය.

කිසියම් ගොවියකුට හෝ කණ්ඩායමකට විෂය දැනුමක් ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට ප්‍රථම පහත දැක්වෙන කරුණු පිළිබඳව සැලකිල්ලක් යොමු කිරීම සාර්ථක සංනිවේදනයක් සඳහා මග පෑදීමක් වනු ඇත.

1. ගොවියාට ඇති අවශ්‍යතාවය.
2. ලබාදෙන දැනුම, පුහුණුව වාසිදායක ද නැද්ද යන බව
3. දැනුම පුහුණුව කොතරම් ප්‍රායෝගි කද යන බව

විවිධ අවස්ථාවලදී ගොවින් සමඟ කථා කිරීමට, අදහස් හුවමාරු කර ගැනීමට සිදුවෙයි. කෘෂි කාර්මික කටයුතු සඳහා වෙන්වූ රජයේ අයාතන, දෙපාර්තමේන්තු සහ වෙනත් සංවිධාන ගොවියා සමඟ නිරතුරුව අදාල නොයෙක් අංශ සම්බන්ධයෙන් හමුවී තොරතුරු හුවමාරු කර ගනිති.

මෙම ආයතන සහ සංනිවේදන පරමාර්ථ කොටස් කළ විට මෙසේ වෙන් කොට හඳුනාගත හැක.

ආයතනය

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
4. බැංකු
5. කෘෂි රක්ෂණ මංඩලය

සංනිවේදන පරමාර්ථ

ගොවි පුහුණු පංති
යෙදවුම් භාවිතය
ජල කළමනාකරණය
කෘෂිකාර්මික ණය
වගා රක්ෂණ ක්‍රම



සංනිවේදනයේ පල ලබාගත් අවස්ථාවක් :
ගොවියන්ගේ මුදල් හා ශ්‍රමය යොදවා සාදනු ලැබූ පැති බැම්මක්

ඕනෑම ආයතනයක දෙපාර්තමේන්තු වක පුද්ගලයෙක් හට සාර්ථක සංනිවේදන යක් කිරීමට අවශ්‍ය නම් ඔහු විසින් ගොවීන්ගේ චරිත ලක්ෂණ හඳුනා ගැනී මට ප්‍රයත්නයක් දැරිය යුතුය. උදාහරණ යක් වශයෙන් ගොවි පුහුණු පංතියක් ගෙන බලමු. මේ පුහුණු පංතියට විවිධ වයස් මට්ටම්වල, විවිධ අධ්‍යාපන මට්ටම් වල, විවිධ කුලවල චරිත ලක්ෂණ ඇති අය සහභාගි වීමට ඉඩ තිබේ. මෙහි සියලු කරුණු දෙස සැලකිලිමත්ව බැලීම තුළින් සාර්ථකව තමාගේ පණිවුඩය දීමට අවස් ථාවක් සලසා දෙනු ඇත.

පණිවිඩය ලබාගන්නා අයගෙන් නොයෙකුත් විෂම ප්‍රතිචාර ඒමට ඇති ඉඩකඩ බොහෝය. අනවශ්‍ය ලෙස ශබ්ද කිරීම්, වාද විවාද කිරීම්, පුහු තර්ක කිරීම් මෙවැනි අවස්ථා වලදී අපේක්ෂා කළ හැක. එහෙත් සංනිවේදකයා සාමකාමී ඉවසන සුළු පුද්ගලයෙක් වශයෙන් කටයුතු නොකලහොත් උපක්‍රමශීලීව කරුණු අව බෝධ කරවීමට තිබෙන මග ඇහිරී යෑමට පුළුවන.

ගොවීන් සමග සංනිවේදනය කිරීමේදී ඉතාමත් ප්‍රයෝජනවත් ගුණාංගයක් වශ යෙන් "සුහදතාවය" සැලකිය හැක. පණි වුඩය දෙන පුද්ගලයා සහ ලබාගන්නා ගොවියා අතර ගොඩ නැගෙන සුහදත්වය මත සංනිවේදනයේ සාර්ථකත්වය රඳා පවතියි. ප්‍රසන්න හදවතක් ඇතිව, අසන්නා හට විශ්වාසය හා සතුට දැනෙන අයුරින් තොරතුරු දීමට හැකියාවක් කිසි යම් පුද්ගලයෙකුට හැකියාවක් තිබේ නම් ඔහු සාර්ථක සංනිවේදකයෙක් යැයි කිව හැක. ඒ පමණක් නොවෙයි ඔහු ඉදිරිපත් කරන කරුණු පිලිගැනීමට ග්‍රාහකයෝ කැමති විය හැක. සාර්ථක සංනිවේදනයක් සඳහා මඟ පාදා ගැනීමට වෙර දරන සංනි වේදකයා හෙයින් පණිවුඩය බෙදා දෙන්නා පහත දක්වන කරුණු පිළිබඳව ප්‍රථම යෙන් සිය අවධානය යොමු කල යුතුය. මෙය එක්තරා ආකාරයක සුදුසු වාතාවර ණයක් ගොඩනගා ගැනීමත් වැනිය.

1. අසන්නන් තුළ නිතර උනන්දුව ඇති කරවීම

2. සියලුම ශ්‍රාවකයන් සමාන ලෙස සැලකීම

3. ගැටළුවක් ගෙන ඒ ඔස්සේ කරුණු සාකච්ඡා කිරීම

4. අවශ්‍ය පරිදි අවශ්‍ය තැනදි විවේක යක් දීම

5. ඒකාකාරී බවින් මිදී විවිධත්වයක් ඇති කිරීම.

6. පණිවුඩය ලබාගැනීමට පැමිණි සියලු දෙනාටම සුවපහසුව සැලසෙන අයුරින් ආසන පිළියෙල කිරීම

7. පුද්ගලිකත්වයට හානියක් නොවන අන්දමට අසන්නන් හා කථාබස් සාකච්ඡා කිරීම,

8. ගොවීන්ගේ ධාරණ ශක්තිය පිළි බඳව අවබෝධයකින් යුතුව කරුණු ඉදිරිපත් කිරීම.

9. ප්‍රායෝගික අභ්‍යාස මඟින් කරුණු වඩාත් සරල ආකාරයකින් පැහැදිලි කරදීම

10. අසා දැනගත් කරුණු වඩාත් තහවුරු කරවීම සඳහා තර්ක කිරී මට අවස්ථාවක් සලසා දීම

තමන් ඉදිරිපත් කිරීමට නැතහොත් තේරුම් කරදීමට යන කරුණු වඩාත් පැහැදිළිව පහසුවෙන් අවබෝධ කරවීම සඳහා චිත්‍ර, ඇඳුරු, දළසේයා සහ හැම්කා නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීම ප්‍රචලිත උපක්‍රමය වශයෙන් භාවිතා කරති. විශේෂයෙන් මෙය ගොවීන් වැනි වැඩි හිටියන්ට තොරතුරු බෙදා හැරීමේදී වඩාත් ප්‍රයෝජනවත් විය හැක.

ගොවීන් සමග සංනිවේදනයේදී ඇතිවිය හැකි බාධා පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කිරීම වැදගත් යැයි පෙනේ. ගොවි- නිලධාරී රැස්වීමක් උදාහරණයක් වශයෙන් ගෙන බලමු. මෙවැනි රැස්වීමකදී තමාට ඉදිරිපත් කිරීමට කරුණු ඇතත් ඇතැම් ගොවීහු නිලධාරීන් ඉදිරියේ කතා කිරීමට මැලි කමක් දක්වති. තමන් භාවිතා කරන වචන, කරුණු ඉදිරිපත් කරන ආකාරයේ කිසියම් අඩුපාඩුවක් ඇතිවේද යන බියක් ඔවුන් හට තිබේ. එසේම වැරදුනොත් අනිත් අය තමන්ට සිනාසෙයි. යන ලජ්ජාවක් සහ බියක් ද ගොවියාට තිබේ. මෙය සමාජ විද්‍යාත්මක බාධාවක් වශයෙන් හැඳින්විය හැක.

කෘමිනාශක මෙරට ගොවියාට හඳුන්වා යුගයේදී එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ට බරපතල ප්‍රශ්නයක් විය. කෘමිනාශක භාවිතය පිළිබඳව ගොවි පුහුණු පංති ආදර්ශන මගින් තොරතුරු ලබාදීමට වැඩපිළිවෙලක් පිළියෙල කොට තිබුණි. දෙපාර්තමේන්තුව මෙම පණිවුඩය දීමේදී කොතරම් ප්‍රයත්නයක් ගත්තත් ගොවීහු ඒ කරුණු එකහෙළාම පිළිගැනීමට සූදානම් වූ බවක් පෙනී ගියේ නැත. කෘමිනාශක පිළිබඳව ගොවියා දැරූ ආකල්පය වෙනස් කිරීමට සෑහෙන කාලයක් ගත විය. මෙය මනෝ විද්‍යාත්මක සංනිවේදන බාධකයක්ය. (එදා ගොවියා දැරූ ආකල්පය නිවැරදි බව අද පළිබෝධ නාශක භාවිතය පිළිබඳ පනතක් හඳුන්වා දීමෙන් සනාථ වෙයි.)

මීළඟට ඇති බාධකය ආර්ථික විද්‍යාත්මක එකකි. සාර්ථක මිරිස් වගාවක් පිළිබඳව තොරතුරු ගොවීන් හට කියා දීමට යන බොහෝ අවස්ථා වලදී පැන නගින ප්‍රශ්නය නම් ප්‍රමාණවත් මුදල් හා රසායනික පොහොර නොමැතිනම් අවශ්‍ය උපදෙස් කොතරම් හොඳින් කියා දුන්නත් ගොවියාට තිබෙන මුදල් සහ පොහොර වැනි ප්‍රශ්න නිසා ඔහුගේ පණිවුඩයෙහි සාර්ථක ප්‍රතිඵල නොලැබීමට අපොහොසත් වෙයි.

සෑබෑ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කොට ගොවියාට හොඳ ආර්ථිකයක් ලබා දීමට නම් අත්‍යවශ්‍ය අංග දෙකක් සම්පූර්ණ විය යුතුයි. ඒවා නම්

1. අදාල ආයතන මගින් නව කෘෂිකාර්මික තාක්ෂනික දැනුමක් ගොවියනට සුදුසු පරිදි ලබාදීම

2. මෙම දැනුම ලබාදීම සඳහා කෘෂිකාර්මික සංවර්ධන ආයතන මගින් සුදුසු ක්‍රමවත් සංනිවේදන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

ක්‍රමවත් සංනිවේදන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ වැදගත් කම මුලින් සාකච්ඡා කල කරුණු වලින් පැහැදිලි වන්නට ඇතැයි සිතමි. ඒවගේම සංනිවේදනය කොතරම් දුරට ගොවියනට බලපාන වාද එහි ඇති වැදගත්කම කුමක්දැයි තේරුම්කර දීමට දැරූ ප්‍රයත්නයේ කිසියම් ප්‍රතිපලයක් ඇතැයි සිතිය හැක්කේ දීමට අදහස් කළ පණිවුඩය ලබාගත් ආකාරය අනුවයි.

අංග සම්පූර්ණ පණිවුඩයක් ගොවියෙකුට හෝ ගොවි කණ්ඩායමටදී ඔහුගේ, ඔවුන්ගේ, හැසිරීම් රටාව වෙනස් කිරීමට නම් ඉහතින් දැක්වූ සංනිවේදනයේ දස පනත ප්‍රයෝජනවත් විය හැක. දීර්ඝ කාලයක් තිස්සේ ගොවියා පුරුදු පුහුණු කල සිතුම් පැතුම් රටාව සිරිත් විරිත්, ආකල්ප ඇගයීම් සහ හැසිරීම් රටාව වෙනස් කිරීම එතරම් පහසු කාර්යයක් නොවෙයි. එහි සාර්ථකත්වය සහ ගතිකත්වය රඳා පවතින්නේ සංනිවේදන මාධ්‍ය සහ සංනිවේදකයාගේ කුශලතාවය මතයි.